**වත්තල මාබෝල නගර සභාව - 2023**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

වත්තල මාබෝල නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට වත්තල මාබෝල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.3 නිරීක්ෂණය හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.28 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගලපා තිබූ මූල්‍ය නොවන ගණුදෙනු ආපසු ගැලපීමේදී එකතුව රු.4,212,860ක ගැලපීම් මොනවාද යන්න දක්වා නොතිබුණි. තවද පොළී ආදායම ලෙස රු.2,589,096ක් ද ක්ෂය ලෙස රු.14,722,770ක් ද අතිරික්තයේ / ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස රු.841,355ක් ද මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස ගලපා තිබුණු අතර රු.446,975ක වත්කම් විකිණීමේ පාඩුව හා රු.2,589,096ක මූල්‍ය පිරිවැය ගලපා නොතිබුණි. | 2024 මුදල් ප්‍රවාහය සැකසීමේදී නිවැරදි කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.29 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී දේපල පිරියත හා උපකරණ කාණ්ඩ 6ක මිලදී ගැනීම් රු.18,458,220ක් වුවද, දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් ලෙස රු.39,972,031ක් ගලපා තිබුණි. තවද දේපල පිරියත හා උපකරණ ඉවත්කිරීමේදී විකුණුම් ලෙස රු.34,211,435ක් ද, පොළී ආදායම් ලෙස රු.2,589,096ක් පමණක් ද දක්වා තිබුණි | -එම- | -එම- |
| (ඇ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.30 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී මුදලින් ලද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩවලින් ලද පරිත්‍යාග ද ඇතුලත්ව රු.8,022,994ක් දක්වා තිබුණු අතර මූල්‍ය පිරිවැය ලෙස මුදලින් ගෙවා තිබූ රු.2,157,580ක් දක්වා නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගබඩා නිකුත් කිරීම් රු.627,731ක් වියදමක් ලෙස ගබඩා තොග ගිණුමට බැර කරනු වෙනුවට ගබඩා වියදම නමින් ව්‍යාජ ණයහිමියකු ඇතිකර ගිණුම්ගත කර තිබුණි. | 2024 ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ ඉටුකරනු ලැබූ ව්‍යාපෘති 3කට අදාලව සම්පිණ්ඩන ශක්තිය සඳහා වන තත්ත්ව පරීක්ෂණ වාර්තා අසමත් වීම හේතුවෙන් අමාත්‍යාංශය මගින් ගෙවීම් කළ නොහැකි බව දන්වා තිබියදී, ප්‍රාග්ධන ප්‍රදාන හා ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබූ රු.5,000,000ක් කපා හැර නොතිබුණි. මේ නිසා ප්‍රාග්ධන ප්‍රදාන හා ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර ණයහිමි හා නොනිමි ගිණුම් ශේෂ ද එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නැවත සම්පිණ්ඩන ශක්තිය ගණනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති නිසා කපා නොහැර රඳවා ගන්නා ලදි. | -එම- |
| (ඇ) | 2021 වර්ෂයේදී ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉටුකළ ව්‍යාපෘති 2කට අදාලව වෙන්කළ රු.2,566,045 ක් වූ ණයහිමි අඩි වෙන්කිරීම් සහ ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති 6ක පිරිවැය එකතුව රු.4,750,837ක් දේපල පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරනු වෙනුවට විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස ගලපා තිබුණි. | 2024 ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. | ව්‍යාපෘති ප්‍රාග්ධනද පුනරාවර්තනද යන්න පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ලිපිගොනු පවත්වා ගත යුතු අතර නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර කුලී ගිණුම් ශේෂය සහ උපලේඛනවල එකතුව අතර රු. 1,372,525ක් වූ නොසැසඳුණු වෙනසක් පැවතුණි. | පරිගණක මෘදුකාංගයේ ඇති වූ ගණනය කිරීම්වල දෝෂයක් වන අතර මෘදුකාංගය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් සහ වගකීම් ප්‍රකාශයෙහි නොසැසඳුණු ශේෂ (අවිනිශ්චිත ගිණුම) ලෙස දක්වා තිබුණු රු.8,150,079ක් සඳහා උපලේඛනයක් හෝ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවීය. | තොරතුරු සොයාගත නොහැකි බැවින් කපා හැරීම සඳහා විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇති බව. | අදාළ උපලේඛනය සහ කාලවිශ්ලේෂණය ඉදිරිපත් කිරීමට හා ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| | VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලනයේ සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 5 ඡේදය. | රාජ්‍ය සේවය තුල ඒකීයත්වයක් පවත්වා ගැනීම පිණිස ඉදිරි මෙහෙයුම් හා ප්‍රගති සමාලෝචන කටයුතු පහසු වන පරිදි එම චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතියෙහි 1 සිට 6 දක්වා වූ සියළු කරුණු ඇතුලත් වන පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කර නොතිබුණි. | පිළිගෙන ඇති බව. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.82,282,721ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 74,202,464 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. |
| (i) | වරිපනම් හා බදු | 57,393 | 60,027 | 71,580 | 54,376 | 57,544 | 57,407 | 48,402 | 62,063 |
| (ii) | කුලී | 21,123 | 27,410 | 26,576 | 17,684 | 16,733 | 21,182 | 22,068 | 16,784 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 954 | 1,106 | 1,099 | 1,769 | 1,797 | 1,129 | 1,958 | - |
| (iv) | වෙනත් ආදායම් | 190,723 | - | 223,429 | - | 103,231 | - | 89,702 | - |
| | | 270,193 | 88,543 | 322,684 | 73,829 | 179,305 | 79,718 | 162,130 | 78,847 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 01 දිනට වූ රු. 58,707,846 ක හිඟ වරිපනම් ශේෂයෙන් 2023 දෙසැම්බර් 31 දිනට අය කර තිබූ මුදල රු.25,352,042ක් වූයෙන් අය කිරීම්වල ප්‍රතිශතය සියයට 43 ක් විය. | පිළිගෙන ඇති බව. | හිඟ වරිපනම් අයකර ගත යුතුය. |
| (ආ) | වටිනාකම රු 50,000 කට වැඩි වරිපනම් ඒකක 163 කට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට පැවති රු. 30,433,738ක් වූ හිඟ ශේෂය අයකර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව තහවුරු කර ගැනීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.තවද වරෙන්තු නිකුත් කර තිබූ දේපළ සංඛ්‍යාව 167ක් බව දක්වා තිබීමෙන් දේපළ සංඛ්‍යාවේ නොසැසඳීමක් නිරීක්ෂණය විය. | වරෙන්තු සඳහා රතු නිවේදන නිකුත් කර ඇති අතර 2024.03.31 දිනට රු.50000 ට වැඩි දේපළ පවතින්නේ 137 ක් පමණක් බව. | හිඟ ශේෂය අයකර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව තහවුරු කර ගැනීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂ 10කට අධික කාලයකින් පසුව හෝ වරිපනම් තක්සේරුවක් සිදු කර නොතිබුණු හෙයින් ඒකක 4999 කින් ඒකක 83 කට අදාලව වරිපනම් තක්සේරු රේටය 0 ක් ද ඒකක 4 කට අදාලව තක්සේරු රේටය රු.10 සිට රු.29 දක්වා ද රු.30 බැගින් අයකරන ඒකක 109 ක්ද රු.31 සිට රු.50 දක්වා අයකරන ඒකක 167 ක්ද පැවතිම නිසා සභාවේ ආදායම් වැඩි කර ගැනීමට නොහැකි වී තිබුණි. | නව වරිපනම් තක්සේරුවක් ඉල්ලා තක්සේරු දෙපාර්තමේන්තුව ලිපි මඟින් දැනුවත් කර ඇති බව. | ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රැස්කළ බලපත්‍ර ගාස්තු ආදායම සියයට 56කින් එනම් රු.859,000කින් ද ඇස්තමේන්තුගත ආදායම සියයට 46කින් එනම් රු.843,000කින් ද අඩුවී තිබුණි. | පිළිගෙන ඇති බව. | හිඟ වරිපනම් ශේෂ කපා හැරීම් මත අදාල දේපලවල ලේඛන නිවැරදි කිරීමක් සිදු කළ යුතුය. |
| (ඉ) | දුරකථන සංඥා කුළුණු ආයතන 07 අදාලව 2023 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු. 233,771 ක් අයකර නොතිබුණි. | මෙම මුදල අයත් ආයතන 04 කින් 2023 වර්ෂයට අදාල රු. 91,866.24 ක මුදලක් ගෙවා ඇති බව. | දුරකථන සංඥා කුළුණු ආයතනවලට ආදාල හිඟ වරිපනම් අය කර ගත යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනය හා කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි හා 2023 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද කර්මාන්ත ප්‍රගති වාර්තාවෙහි දක්වා තිබූ ව්‍යාපෘති සැසඳීමේදී ප්‍රසම්පාදන සැලැස්මෙහි දක්වා නොතිබුණු ව්‍යාපෘති 17ක් අතරින් ව්‍යාපෘති 16ක ඇස්තමේන්තු වටිනාකම රු.18,580,558ක් හා ඇස්තමේන්තු වටිනාකම දක්වා නොතිබූ ව්‍යාපෘතියක ගිවිසුම්ගත වටිනාකම රු.45,000ක් වූයෙන් දළ වශයෙන් එකතුව රු.18,625,558 ක් ප්‍රසම්පාදන සැලැස්මට පටහැනි ව්‍යාපෘති විය. | ඉදිරියේදී සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන සැලැස්මෙහි පලුදු කරන ලද මාර්ග අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රු.1,000,000ක් වුවද සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.16,127,067ක් වැයකර තිබූ අතර ඒ අනුව රු.15,127,067ක් එනම් සියයට 1513ක් ඇස්තමේන්තු මුදලට වඩා වැයකර තිබූ බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සැකසීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව පිළියෙල කර ඒ අනුව ක්‍රියාත්මක විය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(i) දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව පළාත් පාලන ආයතනයකට අදාලව බදු ගිවිස ගන්නට යෙදෙන සෑම ගොඩනැගිල්ලකට, ඉඩමකට, අදාලව ගිවිසගත් දිනෙන් සෑම වසර 3 කට වරක් මාසික කුලිය රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය කළ යුතු වුවද හැදල ඇල අයින කඩ කාමර 14 ක් සඳහා 2019 වර්ෂයේ තක්සේරු වටිනාකම මත සමාලෝචිත වර්ෂයේ මාසික කුලිය අයකරනු ලබන බව නිරීක්ෂණය විය. | හැදල ඇල අයින කඩ කාමර 14 සඳහා 2021.11.23 හා 2023.08.29 දිනැතිව නව තක්සේරුව ලැබී ඇති අතර ඒ අනුව එම තක්සේරුව මේ වන විට ක්‍රියාත්මක කර ඇති බව. | සෑම වසර 3 කට වරක් මාසික කුලිය රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්යමණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2ක පුරප්පාඩු 2ක් ද ද්විතික මට්ටමේ තනතුරු 5ක පුරප්පාඩු 10ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 8ක පුරප්පාඩු 20ක් ද, පවතින බව නිරීක්ෂණය විය. | ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කර ඇත. තවද කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2020 හි 02 ඡේදයේ viii වගන්තිය හා ix වගන්ති ප්‍රකාරව PL වැටුප් කේත දරන තනතුරු සඳහා බඳවා ගැනීම් කටයුතු සිදු කර ඇති බව. | අනුමත කාර්යමණ්ඩයේ පුරප්පාඩු පුරවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |